# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

## නර්තනය ( දේශීය )

විභාග අංකය:..........................................

| 07 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
| --- | --- | --- |

**සැලකිය යුතුයි :**

- අංක 1 සිට 20 තෙක් සියලු ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

<u>**I කොටස**</u>

- ප්‍රශ්න අංක 01 – 05 තෙක් හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර පහත කොටුව තුළින් තෝරා ලියන්න.

01. උඩරට නර්තනයේ වන්නම් නටා අවසන් කරනුයේ .......................................... නැටීමෙනි.
02. " මුණිසිරිපා සිඹිමින්නේ..... කවි පාදය අයත් වනුයේ ......................................ගායනා වලට ය.
03. පහතරට නර්තන ශිල්පය ප්‍රගුණ කළ ආධුනිකයා ................................. සුවිශේෂී උත්සවයක් ලෙස නම් කරයි.
04. .................................. උඩරට නර්තනයේ දී තාලය තැබීමට භාවිත කරයි.
05. සබරගමු නර්තනයේ ශිල්පීය ප්‍රාගුණ්‍ය පෙන්වන අවස්ථාව .................................... සිදු කරයි.

| **කස්තිරම , මඩු බැසීම , අඩව්ව , පන්තේරුව , තාලම්පට , ගුරු වරම් දීම , නැළවිලි කවි , කළගෙඩි කවි** |
| --- |

- ප්‍රශ්න අංක 06 – 10 තෙක් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

06. දිවීම , පෙරලීම , ඇවිදීම ................................ චලනය කි. ( ස්ප්‍රීතික / සංචාරී )
07. හත් අඩියේ භාවිත සරල පියුම නිර්මාණය කිරීමට .......................... භාවිත කරයි. ( ලී පතුරු / ගොප් කොළ )
08. මණ්ඩි පද හා දොඹින පද ........................... නර්තන සම්ප්‍රදායට ආවේනික වේ. ( පහතරට / සබරගමු )
09. රන් තෙළඹු වර්ණනාවේ කවි ගායනා කරන්නේ ......................... නැටුමේ දී ය. ( තාලම් / කුළු )
10. තිත් , තෙයි යන තාල සංකේත භාවිත කරමින් .................. වන්නම නර්තනය කරයි. ( හනුමා / තුරඟා )

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් **A** කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර **B** කොටසින් තෝරා යා කරන්න.

| **A කොටස** | **B කොටස** |
| --- | --- |
| 11. දොං ජිංත ගත දොංත | තාලම් |
| 12. රන්ගිරි මුදුනේ හිරු බබළන්නේ | හමාර පදය |
| 13. ගොඩ සරඹ නර්තනය | මාත්‍රා 2+3 තාලය |
| 14. දණ්ඩි සරඹ | කස්තිරම |
| 15. සඳවට තරුවැල් ඇවිදින් | කුළු කවිය කි. |

- ප්‍රශ්න අංක 16 – 17 තෙක් රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.


A


B

16. රූපයේ දැක්වෙන වාද්‍ය භාණ්ඩය වනුයේ .............................. ( යක් බෙරය / දවුල )

17. රූප සටහනේ දැක්වෙන වාද්‍ය භාණ්ඩය අයත් නර්තන සම්ප්‍රදාය වනුයේ ................................ සම්ප්‍රදාය ය. ( පහතරට / උඩරට )

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

18. දෙවන ගොඩ සරඹ පදයේ කස්තිරම ...................................... වේ.

01. තත් ජිත් තොං නං තා
02. දොම්කිට කිට දොම්
03. තත් ජිත් තක ජිත් තත් ජිත් තොං නං තා
04. තෙයි කිට තෙයි තාම්

19. උඩරට නැටුමේ ආධුනිකයෙකු ශිල්පීය භාවයට පත්වීමේ , පත්වීම් අවස්ථාව හඳුන්වන්නේ මේ නමිනි.

01. සිලම්බු මංගල්‍යය
02. හිස වෙස් තැබීමෙ මංගල්‍යය
03. මඩු බැසීමේ මංගල්‍යය
04. ගුරු වරම් දීමේ මංල්‍යය

20. ගත් ගත් පයත් අසුගෙ ශබ්දත් වසත් සුරිඳු ..... යන පදයේ ඉතිරි කොටස වේ.

01. මුත් කණ්ත කත් වේය තුරඟා
02. යන්නෙන් තොසින් තිදෙන සමඟා
03. ගත් සිත් තොසත් පැවිදි අංගා
04. ගෙන් සෙත් රුගත් නෙර්ත අංගා

( ලකුණු 1 x 20 = 20)

**දෙවන වාර ඇගයීම 2025 - මීගමුව අධ්‍යාපන කලාපය - නර්තනය**

**<u>II කොටස</u>**

- ප්‍රශ්න **03** ට **පමණක්** පිළිතුරු සපයන්න.

01.

I. දෙතිතේ ප්‍රභේද නම් කරන්න. ( ලකුණු 03 )

II. මාත්‍රා 2+3 අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. ( ලකුණු 03 )

III. තුරඟා වන්නමට අයත් කස්තිරම ලියා දක්වන්න. ( ලකුණු 04 )

02.

I. ගැමි නැටුම් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. ( ලකුණු 02 )

II. ඔබ දන්නා ජීවන වෘත්තීන් හා බැඳුනු ගැමි නැටුම් 03 ක් ලියන්න. ( ලකුණු 03 )

III. ගැමි නැටුම්වල සුවිශේෂී ලක්ෂණ 05 ක් ලියන්න. ( ලකුණු 05 )

03.

I. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අදාළ වාද්‍ය භාණ්ඩ වෙන් වෙන් ව ලියන්න. ( ලකුණු 03 )

II. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇඳ කොටස් 03 ක් නම් කරන්න. ( ලකුණු 03 )

III. ඔබ දන්නා විකල්ප වාද්‍ය භාණ්ඩ 02ක් නම් කර ඒවා සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය 02ක් නම් කරන්න. ( ලකුණු 04 )

04.

I. රාමසාන් උත්සවය පැවැත්වීමට හේතු 02 ක් ලියන්න. ( ලකුණු 02 )

II. රාමසාන් උත්සවය සමරන රටවල් 03 ක් ලියන්න. ( ලකුණු 03 )

III. මෙම උත්සවයේ ඇති සංස්කෘතික වටිනාකම විස්තර කරන්න. ( ලකුණු 05 )

05.

I. කළ එළි බැසීම යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න. ( ලකුණු 02 )

II. උඩරට නර්තනය හදාරන ආධුනිකයෙකු කළඑළි බැසීමේ දී සිදුකරනු ලබන චාරිත්‍ර 03 ක් ලියා දක්වන්න ( ලකුණු 03 )

III. නර්තනය හැදෑරීමේ දී ඔබ විසින් පන්ති කාමරයේ දී අනුගමනය කළ යුතු සාරධර්ම 05 ක් ලියන්න. ( ලකුණු 05 )

(ලකුණු 10*3 = 30)